# මතවාද වල වැදගත්කම

නාරද වික්‍රමගේ

කොටි ත්‍රස්තවාදය අවසන් කර රට යළි එක්සේසත් කිරීම ගැන බොහෝ දෙනා රජයට ප්‍රශංසා කරති. ඒ අතරම කොටි ත්‍රස්තවාදය හැර වෙනත් කිසිදු ප්‍රශ්නයක් විසඳීමට රජයට නොහැකි බවට ද විවේචන එල්ල වෙයි.

කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමට හැකි වුනේ ඇයි? එහිදී ආරක්ෂක හමුදා විසින් සුවිශාල වැඩ කොටසක් ඉටු කරන ලද බව සැබෑය. එහෙත් මෙම හමුදාවත් එය භාවිතා කළ අවි ආයුධත් මීට පෙර තිබුනු ආණ්ඩු යටතේ ද පැවතින. මෙම ආණ්ඩුව යටතේ අළුතින් එක් වුනු එක් සාධකයක් නම් දේශපාලන නායකත්වයයි. පෙර පැවති ආණ්ඩුවලට වඩා, මෙම රජය, කොටි ත්‍රස්තවාදයට එරෙහිව ඉහළ සාර්ථකත්වයක් ලබා ගැනීමට මෙම සාධකය විශාල ලෙස හේතු විය.

නමුත් කොටි ත්‍රස්තවාදයෙන් රට බේරා ගත් දේශපාලන නායකත්වය අපට අදටත් අහිමි වී නැත. මහින්ද රාජපක්ෂ මහතා තවමත් මෙරට ජනාධිපති වෙයි. හමුදාව ද තිබේ. හමුදාවට සහ දේශපාලන නායකත්වයට පමණක් කොටි ත්‍රස්තවාදය විනාශ කිරීමට හැකි වුනා නම් එම නායකත්වයට සහ හමුදාවට තවත් බොහෝ ප්‍රශ්න විසඳීමට හැකි විය යුතුය. නමුත් එසේ සිදුවන බවක් නොපෙනේ.

කොටි ත්‍රස්තවාදය අවසන් කිරීමේදී දේශපාලන නායකත්වය මෙන්ම බලපෑ තවත් සාධකයක් වූයේ කොටි ත්‍රස්තවාදය පරාජය කළ හැකි සහ පරාජය කළ යුතු බවට ගොඩනැගුනු මතවාදයයි. මෙම මතවාදය එක් අතකින් ගත් කළ අළුත් මතවාදයක් නොවෙයි. එය මහාවංශයේ ද ඇතුලත් වෙයි. අපට අයත් මේ රට අපෙන් උදුරා ගැනීමට වරින් වර පැමිණෙන පර සතුරන් අපට පරාජය කළ හැකි බවත් අප විසින් මේ රට පර සතුරන් ගෙන් ආරක්ෂාකර ගෙන මතු පරපුරට උරුම කර දිය යුතු බවත් මහාවංශය ජාතියට උගන්වා ඇති අතර පන් දහසක් කල් බුදු සසුන සුරැකීම වෙනුවෙන් ගොඩනැගී ඇති මෙම මතවාදය මහාවංශයටත් වඩා පැරණි බව සිතීම සාධාරණය.

මේ ආකාරයට කිසියම් ප්‍රජාවක් විසින් වසර දෙදහසකටත් අධික කාලයක් තිස්සේ අඛණ්ඩව විශ්වාස කර ඇති සහ ඒ අනුව කටයුතු කර ඇති මතවාදයක් ලෝකයේ තවත් නැත යන්න අපගේ විශ්වාසයයි. ලෝකයේ පැරණි ජන කොටස් වන චීනුන් හෝ යුදෙව්වන් හෝ සතුව එවැනි මතවාදයක් නැතැයි අපි හඟිමු. යුදෙව් ග්‍රන්ථ වලද මෙවැනි මතවාද ඇතුලත් වෙතත් වසර දෙදහසක් තිස්සේ අඛණ්ඩව එම මතවාද වලින් ඔවුන්ව මෙහෙයවී ඇතැයි කිව හැකි නොවේ. එහෙව් කොට මතවාද නිර්මාණය සම්බන්ධයෙන් සිංහලයන්ට බටහිරයන්ගෙන් ඉගෙනගැනීමට දෙයක් වෙයි ද?

මහාවංශ මතවාදය අවශ්‍ය නම් මාක්ස්වාදීන්ගේ ඓතිහාසික භෞතිකවාදය සමග සන්සන්දනය කළ හැක. ඓතිහාසික භෞතිකවාදය විශ්වාස කරන කම්කරුවන් කී දෙනෙක් මේ ලෝකයේ සිටිත් ද?

විශ්වාස කිරීම පැත්තකින් තබා එය විශ්වාස කළ යුතු යැයි මාක්ස්වාදීන් බලාපොරොත්තු වන ඊනියා කම්කරු පංති සාමාජිකයන්ගෙන් කී දෙනෙකුකට (ප්‍රතිශතයක් ලෙස) ඓතිහාසික භෞතිකවාදය ගැන අවබෝධයක් තිබේද? ඓතිහාසික භෞතිකවාදය ප්‍රලාපයක් වීම සහ වැඩ කරන ජනතාව එය විශ්වාස නොකිරීම විශම චක්‍රයක් වී ඇත. මහාවංශ මතවාදය, ඓතිහාසික භෞතිකවාදයට වඩා සත්‍යය; විශ්වාස කළ හැකිය; සත්‍යේක්ෂණයට ලක් කළ හැකිය (verification); නිවැරදි බව ඓතිහාසිකව තහවුරු වී ඇත; එම නිසා සංගතය. (ඓතිහාසික භෞතිකවාදය පිළිනොගන්නා මාක්ස්වාදීන්ට, පවතින ක්‍රමය ගැන බොරු විවේචන ඉදිරිපත් කරමින් ඊට මුක්කු ගැසීමට වඩා වැඩි දෙයක් කළ නොහැක.)

අනෙක් අතින් ගත් කළ කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමේ දී ඉවහල් වූ මතවාදය පැරණි එකක් ද නොවේ. මහාවංශ මතවාදය, අද අභියෝගවලට මුහුණ දිය හැකි ලෙස, නව විවරණ සහිතව ඔප දමා ඉදිරිපත් කිරීම සිද්ධවූයේ පසුගිය වසර විස්සක තරම් කාලය තුළදී වන අතර එහිදී කේන්ද්‍රීය කාර්යභාරය ඉටු කළේ මහාචාර්ය නලින් ද සිල්වා මහතාය. මේ පිළිබඳ ඉතා කෙටි විස්තරයක් ඒ මහතා ගේ වචන වලින්ම, ඒ මහතා 2009 ඔක්තෝම්බර් 28 දින විද්‍යුසරට "පරස්පර සහ බොරු" යන හිසින් ලියා තිබූ ලිපියේ දක්නට ඇති හෙයින් ඒ ගැන කිසිවක් නොලියමු. එහෙත් ඒ මහතා ගේ ජයග්‍රහණය රටේ ද ජයග්‍රහණය වූ බව පවසමු.

මේ රටේ විසඳීමට ඇති එකම ප්‍රශ්නය කොටි ත්‍රස්තවාදය පමණක් නොවේ. එක් පැත්තකින් දෙමළ ජාතිවාදය සහ දෙමළ බෙදුම්වාදය වෙයි. එමෙන්ම දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය, ආදී නොයෙකුත් ප්‍රශ්න වෙයි. අධ්‍යාපන, සෞඛ්‍ය ආදී ක්ෂේත්‍රවල ඇති වී තිබෙන ගැටළු, රජය කෙරෙහි ජනතාව කලකිරවීමට හේතුවී තිබේ. ලෝකයේ භයානකම සහ බටහිර රටවල ආධාර වැඩියෙන්ම ලැබූ ත්‍රස්ත සංවිධානය වන කොටි සංවිධානය පරාජය කළ අපට එතරම් බරපතළ යැයි කිව නොහැකි මේ එකද ප්‍රශ්නයක් හෝ විසඳිය නොහැක්කේ ඇයි? ඊට මූලික හේතුව ඒ සඳහා අවශ්‍ය මතවාද අප විසින් නිර්මාණය කර ගෙන නොතිබීමයි. නිර්මාණය කෙරී තිබුනද ඒවා රජය විසින් නොතකා හැරීමයි.

මෙහිදී, එනම් අවශ්‍ය මතවාද නිර්මාණය කර ගැනීමේ දී, අපට නැවතත් වැදගත් වන පුද්ගලයා වන්නේ, දැනුම නිර්මාණයේ "රහස් අනාවරණයකර ගත්" පුද්ගලයා වන, මහාචාර්ය නලින් ද සිල්වා මහතායි. දැනුම නිර්මාණයට අදාළව, ඒ මහතා, විසින් පෙන්වාදී ඇති කරුණු අතරින් වත්මන් අභියෝග වලට මුහුණ දීමේ දී පහත දැක්වෙන කරුණු හතර වැදගත්ය. (1) දැනුම යනු නිර්මාණය කෙරෙන දෙයක් වන අතර එය, වෙනත් දේ අතර, සංස්කෘතියට සාපේක්ෂව, චින්තනයක් මත පදනම්ව, නිර්මාණය කෙරෙයි. (2) අද අප මත බලෙන් පටවා ඇති බටහිර නිර්මාණය කෙරී ඇති දැනුම ඊනියා වාස්තවික දැනුමක් නොව එය ඔවුන්ගේ සංස්කෘතියට සාපේක්ෂව නිර්මාණය කෙරී ඇති ක්‍රිස්තියානි දැනුමකි. (3) ඕනෑම කෙනෙකුට දැනුම නිර්මාණය කළ හැක්කේ තමන්ගේ සංස්කෘතියට සාපේක්ෂව පමණක් වන අතර අනුන්ගේ සංස්කෘතියකට සාපේක්ෂව දැනුම නිර්මාණය කිරීමට සමත් වූ අයෙකු ගැන දැන ගන්නට නැත. (4) අපත් අනලස්ව අපේ සංස්කෘතියට සාපේක්ෂව දැනුම නිර්මාණය කරනවා නම් බටහිරයන්ගේ ආධිපත්‍යයෙන් මිදිය හැක.

කොටි ත්‍රස්තවාදය පරාජය කළ අපට ජය ගැනීමට තවත් අභියෝග රාශියක් තිබේ. අප එම අභියෝග වලට කොතරම් සාර්ථකව මුහුණ දෙනවාද යන්න මූලික ලෙස තීන්දු කරනු ඇත්තේ අපිට අවශ්‍ය දැනුම නිර්මාණය කර ගැනීමට අප සාර්ථක වන තරම අනුවයි. මහින්ද රාජපක්ෂ මහතා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එරෙහිව ඉහලම සාර්ථකත්වය ලබාගත් සිංහල පාලකයා ලෙස සැලකීම නිවරැදියැයි අපි සිතමු. (ඒ අතර මහින්ද රාජපක්ෂ මහතා බලයට එන විට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට බහින කලාව ලබා තිබූ බවද අප අමතක නොකළ යුතුය.) අප කොටි ත්‍රස්තවාදය පරාජය කිරීමට සමත් වී ඇත. එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පරාජය කිරීමට සමත් වී නැත. අපට එය කළ හැක්කේ ජනතාව ආවේශ කර විය හැකි දැනුම අප සිංහලත්වය මත පදනම්ව නිර්මාණය කරයි නම් පමණි.

ජනතාව ආවේශ කර වීමේ දී අපේ දැනුම කොතරම් සිංහලත්වය මත පදනම් වෙයි ද, සහ එම දැනුම කොතරම් සංගත වෙයි ද යන්න බලපායි. කොටි ත්‍රස්තවාදය පරාජය කිරීම සඳහා නිමැවුනු සිංහලත්ව මතවාද පිළිගෙන රජය කටයුතු කළා සේ අනෙකුත් ක්ෂේත්‍රවලද අපේ දැනුම මත පදනම්ව ක්‍රියා කිරීමට අවශ්‍ය දේශපාලන නායකත්වය සැපයීමට මහින්ද රාජපක්ෂ මහතා සමත් වෙයි නම් ඔහු මහා මහින්ද ලෙස ඉතිහාසගත වනු ඇත. අප විසින් මෑත කාලයේ ප්‍රශ්නයක් විසඳුවායැයි කියා විසඳා ඇති එකම ප්‍රශ්නය කොටි උවදුර පමණක් යැයි කීම අතිශයෝක්තියක් නොවේ. එමෙන්ම සෑම විටෙකම බටහිර දැනුම අනුව ක්‍රියාකරන අප විසින් මෑත කාලයේ දී ප්‍රශ්නයක් විසඳීම සඳහා සිංහලත්ව මතවාදයක් මත පදනම් වුනු එකම සහ ප්‍රථම අවස්ථාව ද හමුදා ක්‍රියාමාර්ගයක් හරහා කොටි පරාජය කිරීමය යන්න අපට මග හැර යා හැකි කරුණක් නොවේ.

2009 - 11 - 05.

<u>පසුවදන</u>

මෙම ලිපියේ කොටස් කිහිපයක් 2009 නොවැම්බර් 18 වන දින විදුසර පුවත් පතේ පළ විය.
http://www.vidusara.com/2009/11/18/readers2.html